# වාරිමාර්ග අමාත්‍යාංශය

## වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ

## ජාත්‍යන්තර පුහුණු ආයතනය - කොත්මලේ

KITI - IWM

# වාරිමාර්ග තාක්ෂණවේදය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ආධුනිකයින් බඳවා ගැනීම - 2023

කොත්මලේ, වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනය තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ජාතික වෘත්තීය කුසලතා 06 වන මට්ටම සඳහා ප්‍රතීතනය කර ඇති පූර්ණ රාජ්‍ය ආයතනයකි. මෙම ආයතනය මගින් පවත්වනු ලබන තුන් අවුරුදු පූර්ණ කාලීන වාරිමාර්ග තාක්ෂණ වේදය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික, අවිවාහක අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පුහුණු පාඨමාලා ද අවුරුදු නේවාසික පුහුණුවකින් හා එක් අවුරුදු ක්ෂේත්‍ර පුහුණු කාලයකින් සමන්විත වේ.

**1) ආධුනිකයින් බඳවා ගැනීම**

* **අවම සුදුසුකම්**

I. අයදුම්කරු අ.පො.ස.(සා.පෙළ) විභාගය, ඉංග්‍රීසි විෂය සඳහා සම්මාන සාමාර්ථ සහිතව සමත් වී තිබිය යුතුය.

ii. අ.පො.ස. (උ.පෙළ) විභාගය ගණිත විෂය ධාරාවෙන් විෂයයන් 03 ක් එක් වරකින් සමත් වී තිබිය යුතුය.

III. අයදුම්කරු, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට වයස අවුරුදු 26 ට අඩු යහපත් මානසික හා කායික සෞඛ්‍යයෙන් හෙබි අයෙකු විය යුතුය.

**2) පුහුණුව සඳහා බඳවා ගන්නා ක්‍රමවේදය**

I. සුදුසුකම්ලත් අයදුම්කරුවන් සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය යන විෂයන්ට අදාලව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන තරග විභාගයකට පෙනී සිටිය යුතුය. ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු ලිවීමට කාලය පැය 1 කි.

II. ලිඛිත විභාගයෙන් සමත්වන අයදුම්කරුවන්, සම්මුඛ පරීක්ෂණයක් සඳහා ඉදිරිපත් විය යුතුය.

III. ලිඛිත විභාගයෙන් හා සම්මුඛ පරීක්ෂණයෙන් ඉහළින්ම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පාඨමාලාව සඳහා බඳවා ගනු ලැබේ.

**3) අයදුම්පත් ඉදිරිපත් කිරීම් විස්තර**

I. ආයතනයේ වෙබ් අඩවියට පිවිසීමෙන් අදාළ අයදුම්පත් බාගත කළ හැකිය. (**www.kitiiwm.gov.lk**)

II. අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කළ යුතු අතර, නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් අධ්‍යයන ආයතනයේ ආයතනාධිපති වෙත යොමු කළ යුතුය.

III. මෙම බඳවා ගැනීමට අදාළ වෙනත් තොරතුරු 081-2356372 යන දුරකථන අංකයට, ආයතනයේ අධ්‍යයන අංශයේ භාගත ආචාර්යදස මහත්මිය ඇමතීමෙන් ලබා ගත හැකිය.

IV. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2023 මාර්තු 10 වන දින වේ.

V. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් ආයතනාධිපති, වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනය, රිවර්සයිඩ්, මාවතුර යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් ( 9''X4'') ලියුම් කවරයක බහා එහි වම්පස ඉහළ කෙළවරේ වාරිමාර්ග තාක්ෂණවේදය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව - 2023 ලෙස පැහැදිලිව සඳහන් කළ යුතුය.

**4) විශේෂ කොන්දේසි**

I. පුහුණු පාඨමාලාව පවත්වනු ලබන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි.

II. මෙම පුහුණු පාඨමාලාවල අධ්‍යයන කටයුතු සඳහා යන සියලු වියදම්, ශ්‍රී ලංකා රජය මගින් දරනු ලබන අතර, නේවාසික පහසුකම්ද පුහුණු ආයතනය මගින් සපයනු ඇත. එහෙත් පුහුණු කාලය තුළදී, ආහාරපාන, භෞතික හා අනෙකුත් පෞද්ගලික වියදම් අභ්‍යාසලාභීන් විසින් දැරිය යුතු වේ.

III. තෝරා ගනු ලබන අභ්‍යාසලාභීන්, අභ්‍යාස ආයතනයේ විනය හා ආචාර ධර්ම වලට යටත්ව පුහුණුව අවසන් කරන බවට මෙන්ම පුහුණු කාල සීමාව සාර්ථකව අවසන් කරන බවට බැඳෙන ගිවිසුමකට අත්සන් කළ යුතුය.

IV. පුහුණු කාලය අවසන් කිරීමට මත්තෙන්, පුහුණුවෙන් ඉවත් වන්නේ නම් එතෙක් ඔහු හෝ ඇය වෙනුවෙන් රජය මගින් දැරූ වියදම ආපසු ගෙවීමට බැඳී සිටින අතර, ඒ සඳහා වූ ඇප ගිවිසුමකට එළඹිය යුතුය.

V. පුහුණු කාලය තුළ පවත්වනු ලබන සමාසික, වාර්ෂික මෙන්ම පුහුණු කාලය අවසානයේදී පවත්වනු ලබන අවසන් ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ වලදී සමත් වන ආධුනිකයන් සඳහා NVQ - Level 6 මට්ටමේ ඩිප්ලෝමා සහතිකයක් පුහුණු ආයතනය විසින් නිකුත් කරනු ලබන අතර, පුහුණුවට අදාළ රැකියා ලබා දීමට, මෙම අමාත්‍යාංශය හෝ පුහුණු ආයතනය බැඳී නොසිටියි.

VI. අයදුම්කරුවන් වෙනත් කිසිදු පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී නොතිබිය යුතුය.

**යූ. ඩී. සී. ජයලාල්**

**ලේකම්,**

**වාරිමාර්ග අමාත්‍යාංශය**

tamilguru.lk